# කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව
## முகாமைத்துவக் கணக்காய்வுத் திணைக்களம்
## DEPARTMENT OF MANAGEMENT AUDIT

මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு | MINISTRY OF FINANCE
මහලේකම් කාර්යාලය, කොළඹ 01 | செயலகம், கொழும்பு 01 | The Secretariat, Colombo 01


මගේ අංකය / எனது இல / My No: DMA/AMC/M/2021/2
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2021.01

**ප්‍රධාන අභ්‍යන්තර විගණක/අභ්‍යන්තර විගණකගේ අවධානය පිණිසයි.**

අමාත්‍යාංශ ලේකම්/රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානීන්/දිස්ත්‍රික් ලේකම්
.....................................

**විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම - 2021**

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 41 වන වගන්තිය සහ අංක DMA/1-2019 හා 2019.01.12 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවීමට කැමැත්තෙමි.

02. 2020 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සඳහා Covid -19 ගෝලීය වසංගතය නිසා අපහසු තත්ත්වයන් මතු වුවද බොහෝ අමාත්‍යාංශවල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එම දුෂ්කරතාවයන් මධ්‍යයේ වුව ද යම් පමණකට පැවැත්වීමට කටයුතු කර ඇති බවත් එමගින් ඵලදායී ප්‍රතිඵල ලබා ඇති බවත් නිරීක්ෂණය වූ බව ස්තුති පූර්වකව සිහිපත් කරමි.

03. ඒ අනුව 2021 වර්ෂයේදී ද ඔබ ආයතනයේ අභ්‍යන්තර විගණන වාර්තා, විගණකාධිපතිගේ විගණන වාර්තා, ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ කාර්තු ඇගයීම් වාර්තාව සහ රාජ්‍ය ගිණුම් කාරක සභාවෙන් පෙන්වා දී ඇති ගැටළු අඛණ්ඩව සමාලෝචනය කොට අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීමට මග පෙන්වනු ඇතැයි අපේක්ෂා කරමි.

04. තවද අප දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති කළමනාකරණ විගණන චක්‍රලේඛ වලට ද වරින් වර නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ හා උපදෙස්වලට ද අවධානය යොමු කරමින් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු අතර ඊට අදාල න්‍යාය පත්‍රය සමඟ ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් සම්පූර්ණ කළ යුතු කාර්තුමය ඇගයීම් වාර්තාව ද අදාල රැස්වීමට ප්‍රථම අප වෙත එවීමට කටයුතු කරන ලෙස ඔබගේ ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයාට උපදෙස් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

05. එමෙන්ම මෙහි පසුපිට සඳහන් කරුණු කෙරෙහි ඔබගේ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ අවධානය යොමු කරවන ලෙස ද කාරුණිකව ඉල්ලා සිටිමි.

06. 2021 වර්ෂය සඳහා ඔබ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටුවේ භාණ්ඩාගාර නියෝජිත ලෙස කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ .......... මයා/මිය පත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. ඔහුගේ/ඇයගේ දුරකථන අංකය ............................... වේ.

එස්.ඒ. චන්ද්‍රිකා කුලතිලක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත : ප්‍රධාන අභ්‍යන්තර විගණක


කාර්යාලය / அலுவலகம் / Office: 2484816, 2484500, 2484600
අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் நாயகம் / Director General: 2484543
ෆැක්ස් / பெக்ஸ் / Fax: 2449496
වෙබ් අඩවිය / வெப் சைட் / website: www.treasury.gov.lk

1. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කර ජනවාරි 31 දිනට පෙර කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.

2. ප්‍රාරම්භක වාර්තාව සකස් කර ජනවාරි 31 දිනට පෙර ලබා දීම.

3. ජාතික විගණන පනතේ අංක 40 පරිදි, අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තාවල මෘදු පිටපත් අප දෙපාර්තමේන්තුවේ dmatreasury.aq@gmail.com දරණ විද්‍යුත් තැපැල වෙත යොමු කිරීම. (එහි දෘඩ පිටපත් අවශ්‍ය අවස්ථාවක දී ලබා ගැනීම සඳහා ගොනු ගත කර තබන්න.)